
# අපි දෙන්නම අසරණයි තාත්තේ !



මේක බරපතල රිය අනතුරක් ළමයට ඉක්මනින් රුධිරය අවශ්‍යයි. දරුවගේ ජිවිතය රැඳිලා තියෙන්නේ ඒ මත. ළමයාගේ තාත්තට පුළුවන් වෙයි එයාට ලේ දෙන්න. කවුරු වුනත් එයා ඉක්මනින් ඒක කරන්න ඕන." වෛද්‍යවරයා, කියත්ම දිනේෂිගේ මව සිහිසුන්ව බිම ඇඳුනි. යාළුකමේ උදාරත්වය මට හැඟුණි. ඇගෙ " ගතත්, සිතත් සුව කිරීමට නම් ඇගේ පියා අවශ්‍යම වේ. මගේ හැඟුම් තේරුම් ගත් තාත්තා "අපි ගිහින් එයාව හොයගමු" කියා මා හා පිටත් විය.

"වර්ෂ 1996 දෙසැම්බර් මස 08 වන දින සිට දරුවාගේ තනි අයිතිය හා භාරකාරත්වය ඇගේ මෑණියන්ට පැවරෙන වගයි." අම්මාගේ මුහුණේ සතුට කොතෙක් දැයි නොදන්නා නමුත් තාත්තාගේ මුහුණ වැස්සට ආසන්න අහස් කුස මෙන්යැයි මට සිතුනි. තාත්තා ආපිට හැරුනේ අවසන්වරට මා දෙස බලා මුහුණ බිමට සඟවා ගනිමින්ය. අම්මා මා වඩාගෙන යනවිට මම මාගේ පුංචි අත දිගුකර තාත්තාට ගොඩක් දේ කීමට තැත්කරත් ඔහුට එය නොඇසුනා විය යුතුය.

මේ සියල්ලටම මුල මම ගැහැණු දරුවකුවීම බව දිනක් අම්මා මා සමග කියු විට "ඒත් අම්මේ කවුරු වුනත් මම තාත්තගේ නේද?" යන ප්‍රශ්නයට උත්තර දීම වෙනුවට හිමින් හිමින් කඳුළු බිඳු දෙකක් බිමට පතිත විය. මාමලා, නැන්දලා, පුංචිලා, බාප්පලා මාගේ රැකවරණයට එතැන් සිට උර දුන්නෝය.

කාලය කෙමෙන් ගෙවී යයි. ඔබේ දියණිය දැන් කෙතරම් නම් ලොකුද? තාත්තේ ඔබේ ඇස්දෙකම මට ඇති බව අම්මා නිතර පවසයි. පිය සෙනෙහස දැණුනු විගස කැඩපත ළඟට දිවගොස් ඒ ඇස්දෙක තුළින් කෙනෙක් ඔබ දැකීමට උත්සාහ කළත් එය ව්‍යාර්ථ වේ. පාසල ඇරී ගෙදර බලායන ගමන තුළද, මගේ සිහින ලොව තුළද මම ඔබව සොයමි. ඉතිං තාත්තේ බලාපොරොත්තුවේ හිණිපෙත්තටම ළං වී ඇති විට එක්වරක්වත් ඔබේ දියණිය බැලීමට පැමිණෙන්න.

දිනේෂි, මාගේ හොදම යෙහෙළියගේ දිනපොත තවත් මට කියවීමට නොහැකි විය. කුඩා කළ සිට අප දෙදෙනා සහෝදරියන් ලෙස එකට සිටියෙමු. තාත්තා පිළිබඳ ගීතයක්, රචනයක් ලියන සෑම විටම තාත්තලා සිටින අපේ කවිවිවලට වඩා ඇගේ රචනය රසවත් විය. ඇගේ සෑම දුකේදී මෙන්ම සැපේදීත් මම ඇය සමග සිටියේ කෙනෙක් හෝ ඇගේ දුක තුනීකරන්නටය. කිසිම දිනක මම ඇගේ තාත්තා ගැන නොඇසුවත් විටක ඇය කියන සමහර දේ බොහෝ කලක් මා වටා රැව්පිළි රැව්දෙමින් පවති. දිනක් "ෂිරෝ මට තාත්තා ගැන මතක්වෙන තරමටම තාත්තටත් මාව මතක් වෙනවා ඇති නේද?" මෙයට පිළිතුර මම තවම සොයමි.

දිනේෂි ආත්ම ශක්තියෙන් පිරුණු බව සෑමවිටම මට සිතේ. සියලු බාධක වලට මටත් වඩා හොඳින් මුහුණ දෙන ඇය තාත්තා පිළිබඳව කිසිවෙකු අසන ප්‍රශ්න වලට කිසිඳු චකිතයකින් තොරව උත්තර දෙයි. "මම තාත්තගේ නමයි, වයසයි, එඩ්රස් එකයි, උපන් දිනයයි, රස්සාවයි විතරයි දන්නේ. ඒකත් උප්පැන්නේ තියන නිසා" දිනක් ඇය මා හා පැවසු විට මම විශ්මයානුකූලව ටික වේලාවක් සිටියෙමි. මීට වඩා තාත්තා ගැන දරුවෙක් දැනගන්න ඕනේද?" ඇය මගෙන් විමසුවිට දෙපැත්තට හිස වැනු නුමුත් "ඔව් දිනේෂි ඔව්" යැයි මට කියාගැනීමට නොහැකි විය.

"ෂිරෝ දැං ඉස්පිරිතාලෙට යන්න වෙලාව හරි. කඳුළු පිහිදාගෙන ලෑස්ති වෙන්න" මගේ දැහැන බිඳ දමමින් තාත්තාගේ හඬ මට ඇසුනි. "ඔව්, දිනේෂි මගේ යාළුවා මම එයා ගාවට යන්න ඕනේ" හෙමිහිට මටම මුමුණාගත් මා සිහිනෙන් මෙන් ඇඳගෙන ඇය අසලට ගියෙමි.

"දිනේෂි මම ෂිරෝ. එක පාරක් ඇස් ඇරලා මං දිහා බලන්න" කියා කෑ ගසා මම ඇයට කීවත් ඇය ඇගේම ලොවක තනි වී ඇත. මම කියන කිසිම දෙයක් ඇයට ඇසෙන්නේ නැත.

"දිනේෂි මම ඔයාගේ යාළුවා, ඔයාට බෑ මාව දාලා යන්න. කීවත් ඈ නිසොල්මන්ය. මගේ තාත්තා මාව කාමරෙන් එළියට ගෙන මාව සනසන්නට වෑයම් දරන්නට විය.

මේක බරපතල රිය අනතුරක් ළමයට ඉක්මනින් රුධිරය අවශ්‍යයි. දරුවගේ ජිවිතය රැඳිලා තියෙන්නේ ඒ මත ළමයාගේ තාත්තට පුළුවන් වෙයි එයාට ලේ දෙන්න. කවුරු වුනත් එයා ඉක්මනින් ඒක කරන්න ඕන." වෛද්‍යවරයා, කියත්ම දිනේෂිගෙ මව සිහිසුන්ව බිම අඳුනි.

යාළුකමේ උදාරත්වය මට හැඟුණි. ඇගෙ ගතත්, සිතත් සුව කිරීමට නම් ඇගේ පියා අවශ්‍යම වේ. මගේ හැඟුම් තේරුම් ගත් තාත්තා "අපි ගිහින් එයාව හොයගමු" කියා මා හා පිටත් විය.

දෛවය සෑමවිටම නපුරු නැත. දිනේෂිගේ පියා රිය අනතුර ආරංචි වී ඈ බැලීමට දිවවිත් අවුරුදු ගණනාවක් සිරකරගෙන සිටි පීතෘත්වයට යටත් වුනේය. පිය සෙනෙහස කෙතරම් විශාල දැයි ඔහුගේ දෑසින් වැටෙන උණු කඳුළු බිඳු මට පසක් කර දුන්නේ එවිටය.

"අපි නොදන්න කෙනෙක් කොලේක ලියලා, කටින් කිව්වට කොහොමද මගේ දුව මගේ නෙවෙයි කියන්නේ. එයා ගැන අයිතියක් කවුරු කොහොමෙ කිව්වත් මට තියෙනවා." ඇත්තටම මේ අවුරුදු ගාණක් තමන්ගේ දුවව බලන්නවත් ආපු නැති තාත්තා කෙනෙකුගෙහැඟීමක් ද?

ඔහුගේ රුධිරය යළිත් වරක් දිනේෂිගේ ජිවිතයට ජිවයක් ගෙන දුන්නේය. තත්පරයෙන් තත්පරය, පැයෙන් පැය, දිනෙන් දින ඇය නැවත උපන්නාය. පුදුමය නම් ඇගේ පියා සෑම තත්පරයකම ඇය අත්නොහැර ඇය ළඟටම වී සිටීමය. වෛද්‍ය විද්‍යාවේ විශ්මයට තවත් අභියෝගයක් එල්ල කරමින් දෛවය විසින් ඇයව සුව කරන ලදී.

ජිවිතයේ මම ඒ ලබපු ආශ්චර්යමත් මෙහොතේදී ඇය, දිනේෂි හෙමිහිට ඇස් ඇරියේය. තත්පර ගණනාවක් එක එල්ලේ බලා සිටි ඇය සියලු දෙනා දෙසත්, ඇගේ අතේ ගසා ඇති රුධිරය දෙසත් මොහොතක් තම පියා දෙසත් බලා හිඳ "අපි දෙන්නම අසරණයි තාත්තේ" යැයි හෙමිහිටි මිමිණීය.


කේ. කුෂානි කොස්වත්ත

11- බී

කු/ශුද්ධ වූ පවුලේ බාලිකාව

කුරුණෑගල





පදික වේදිකාවක කොණක වාඩිගෙන සිටි දෙනෙත් නොපෙනෙන එක්තරා කොලු ගැටයෙක් පුවරුවක් අල්ලාගෙන සිටියේ මහමග යනෙන අයට පෙනෙන පරිදිය. එහි ඉතා පැහැදිළි අකුරෙන් මෙසේ ලියා තිබිණි. මගේ දෙනෙත් නොපෙනේ. කරුණාකර මට උදව් කරන්න. සෑමදාම මේ පුවරුව අල්ලාගෙන සිටියත් ඔහු ඉදිරියේ තබා තිබුණු කාසි දමන බඳුනට කිසි දිනක යහමින් මුදල් වැටුණේ නැත. මේ ගැන විපරමින් සිටි එක්තරා පුද්ගලයෙක් දිනක් අන්ධ කොළුවා අසලට පැමිණ ඔහුගේ බඳුණේ තිබුණු කාසි ගණන් කොට නැවතත් එම බඳුනටම දමා ඔහු ඔසවාගෙන සිටි පුවරුව ගෙන එහි යමක් ලියා එතැනින් නික්ම ගියේය. පුදුමයකට මෙන් අන් කවර දිනකටත් වඩා එදින එම අන්ධ කොලුවාට යහමින් මුදල් ලැබිණ.

එදින සවස් වරුවේ තමා අසලට නැවත පැමිණෙමින් සිටි තැනැත්තාව පියවර තබන හඬින්ම හඳුනාගත් කොලුවා මෙසේ ඇසීය. ඔබ නේද අද උදේ මේ පුවරුව යමක් ලිව්වේ ? ඔව් මම තමයි අමුත්තා පිළිතුරු දුනි. කුමක්ද ඔබ කළ වෙනස ? මම කිසිම වෙනසක් කළේ නැහැ. නමුත් මම ඔබ ලියා තිබුණු දේ වෙනත් ආකාරයකින් ලියා තැබුවා.
ඒ කොහොමද?
එහෙනම් අහගන්න... අද සුන්දර දවසකි.. එහෙත් මම එය නොදකිමි... එපමණයි මා කල වෙනස....
අමුත්තා සිදුකල වෙනස නිසා කොලු ගැටයා තමා අන්ධයෙක් බවට හඳුන්වා දුන් වගන්තියට කිසිඳු හානියක් සිදු වී නොමැති බව පැහැදිළිය. එහෙත් ඔහු කළ වෙනස සුවහසක් ජනයා තුළ අනේක චිත්ත රූප හා සිතුවිළි මවන්නට සමත් වී ඇති අයුරු අරුමයක් නොවේද? අපි සෑවොම එළැඹෙන එළැඹෙන දින දකිමු. එහෙත් ඒ හැම දිනක්ම සුන්දර බව නොදකිමු. ලයිට් බිල්, වතුර බිල්, ගෑස් බිල්, ගෙවල් කුළි, කැපිළි, කෙටිලි, එරවිළි, ගෙරවිළි මැද වුවද කුරුල්ලෝ හඬ නගති. මද සුළං හමා යයි. ගහ කොළද නැළවෙයි. විටෙක ගහ කොළ කඩා වැටී, චන්ඩ මාරුත හමා යනවිට කුරුල්ලෝ මුනිවත රකින බවද සැබෑය. එහෙත් ලොව යථා ස්වභාවය මොනවට පෙන්වන අසුන්දරම දසුනක් නොවේ එයත්.
සෑම දෙයක්ම වෙනත් කෝණයකින්, නවතාවයකින් සහ නිර්මාණාත්මකව බලන කළ ලෝකය ජයගත හැකි අයුරු පහදා දෙන සොඳුරු සිත්තමක් බඳු පුංචි කථාවකි මේ.

**සාමන්ත තැන්නගේ**